# **Van Gogh in Sri Lanka** සිතුවම් දැක්ම පිළිබඳව පසු වදනක්



ජෝමෝ උඩුමාන් විසිනි

ෆරීඩ් උඩුමාන් කලා සංසදය (Fareed Uduman Art Forum) "**Van Gogh in Sri Lanka**" නමින් සිතුවම් දැක්මක් Sky Gallery හිදී නොබෝ දා එළි දක්වන ලදී. එහිදී වින්සන්ට් වැන් ගෝ (Vincent Van Gogh) විසින් නිමර්ාණය කරන ලද සිතුවම් එකතුවක් ඒවායේ මුල් කෘති වලට සැම අයුරකින්ම සමාන ලෙස මුද්‍රිතව ඉතා අලංකාරවත් ලෙස රාමු ගත කර ප්‍රදශර්නය කරන ලදී. කිසි කලෙකත් අත් නොවිඳි නවමු අත්දැකීමක් වූ මෙමගින් පුළුල් පරාසයක් නියෝජනය කළ සිතුවම් ලෝලීන්ගේ තවත් එක් පැතිකඩක් විද්‍යාමාන කරන ලදී. මෙම අපූවර් අත්දැකීම මතක සටහන් අතරට එක් කර ගැනීමට බොහෝ දෙනෙකුට අවශ්‍ය විය.

Saul Bellow විසින් 1976 නොබෙල් ත්‍යාගය පිරිනමන අවස්ථාවේදී විද්‍යාව සහ කලාව යන මැයෙන් පවත්වන ලද දේශනයේදී කරන ලද ප්‍රකාශය ප්‍රදශර්නය පැවැති දිනවලදී මාගේ මතකයට නැගුණි. එනම් පුහු මානය, බුද්ධිය සහ පුරුදු මගින් ගොඩ නගන අප වටා ඇති සියලු දෑ විනිවිද දැකිය හැක්කේ සිතුවම් කලාව තුළින් පමණි. එසේම Jean - Auguste - Dominique Ingres විසින් කරන ලද ප්‍රකාශයක්ද මාගේ සිහියට නැගුනි. විශිෂ්ට නිමර්ාණයන්ගේ ස්වභාවය විය යුත්තේ මායාවකින් අපව වශීකෘත කිරීම නොවේ. ඒවායේ ස්වභාවය විය යුත්තේ අපට කිසියම් බලපෑමක් ඇති කිරීම තුළින් අපගේ රෝම කූප හරහා අප තුළට කා වැදීමයි. Pablo Picasso පවසන ලද්දේ අපගේ එදිනෙදා ජීවිතයේ දූහුවිලි අපගේ ආත්මයන් තුළින් සෝදා හැරීම කලාව මගින් සිදු කරන බවයි. මෙම සියලු ප්‍රකාශයන් කොතරම් සත්‍ය ද යන්න මා හට පසක් වූයේ ප්‍රදශර්නය නැරඹීම සඳහා දිවයිනේ නන් දෙසින් සමාජයේ සියලු පැතිකඩ නියෝජනය කරමින් පැමිණි බාල, මහලු සිතුවම් ලෝලීන් සමග මා පැවැත්වූ පිලිසඳර තුළිනි. සිතුවමින් සිතුවමට සෙමින් සෙමින් පා නගමින් ඒවා රස විඳිමින් සහ විශ්ලේෂණය කරමින් වැන්ගෝ ගේ විශිෂ්ට නිමර්ාණ 51ක් ඉතා සමීපව නැරඹීමේ විරල අවස්ථාවක් ලද සිතුවම්ලෝලීන්ට ඒ තුළින් අපූවර් අත් දැකීමක් තම ජීවිතයට එක්කර ගැනීමේ භාග්‍යය උදාවිණ. ඇතැම් දිනවල 500 කට අධික පිරිසක් මෙම ප්‍රදශර්නය නැරඹීම සඳහා පෙළ ගැසී සිටිනු දක්නට ලැබිණ. එබැවින් සිතුවම් ලෝලීන් හට තවදුරටත් මෙය නැරඹීමේ අවස්ථාව සලසා දීම සඳහා ප්‍රදශර්න කාල සීමාව තවත් සතියකින් දීඝර් කිරීමට සිදුවිය.

අනපේක්ෂිතව පැමිණි මෙම පිරිස දැකීමෙන් අපද වික්ෂිප්ත විය. මෙම රැල්ල ඇතිවූයේ කෙසේද? ශ්‍රී ලංකාව තුළ මෙතරම් විශාල පිරිසකගේ හදවතට සහ ආත්මයට වැන් ගෝ (Van Gogh) මෙතරම් සමීප වූයේ ඇයි? යාපනය, මහනුවර, ගාල්ල, මාතර, මොණරාගල අම්පාර, කෑගල්ල, මීගමුව සහ බෙන්තර වැනි ප්‍රදේශවලින් දුම්රිය සහ බස් රථ ආසන වෙන් කරවාගෙන පැමිණි පිරිස් සමග මා මොහොතකට දොඩමළු වූයෙමි. මව්වරු කුඩා දරුවන්ව වඩාගෙන ඉහළ අහසට විහිදුනු Sky Gallery පියගැටපෙළ තරණය කළහ. වැඩිහිටි පිරිස් කිසිදු ආයාසයකින් තොරව පියගැට පෙළ තරණය කළ අතර ඇතැම් තරුණ පිරිස් මදක් ගිමන් හරිමින් යනු දක්නට ලැබිණ. දිනපතා දුරකථන මගින් බොහෝ දෙනෙකු ටිකට් පත් වල මිල ගණන් සහ ඒවා ලබා ගත හැකි ස්ථාන පිළිබඳව විමසන ලදී. ප්‍රදශර්නය සඳහා කිසිදු ගාස්තු අයකිරීමක් නොමැති බව දැනගත් විට ඔවුන්ට ඒ පිළිබඳව ස්තුතිය පළ කිරීමට වචන නොමැති තරම් විය. ඔවුන් සියලු දෙනාම පාහේ ඉතා සරල සත්‍ය වශයෙන්ම සිතුවම් වලට හා කලාවට ඇල්මක් දැක්වූ මා සිතුවේ නැති ආකාරයේ කලාවට ආදරය කරන කලා රසිකයන් පිරිසක් විය. මා කොතරම් වැරදි සහගත දැයි මට සිතිනි.

ඔවුහු වැන් ගෝ (Van Gogh) පිළිබඳව බොහෝ දේ දැන සිටියහ. ඔහු ගත කළ පීඩාකාරී ජීවිතය පිළිබඳව පුළුල් දැනුමක් ඔවුන් හට තිබුණි. වින්සන්ට් වැන් ගෝ (Vincent Van Gogh) ගේ තරු පිරි රාත්‍රිය (Starry Night) සිතුවම, ඔහු ආදරය කරන ලද මෙන්ම ඔහුට අහිමි වූ ආදරවන්තියන් පිළිබඳ තොරතුරු, ඔහුගේ අපූර්ව සිතුවමක් වූ සූරියකාන්ත මල් (Sun Flowers), Gauguin සමග කහ පැහැති නිවසෙහි ඔහු ගත කළ ජීවිතය මෙන්ම වයස අවුරුදු තිස් හතේදී ඉතා කණගාටුදායක ලෙස නිමවූ ඔහුගේ ජීවිතය පිළිබඳව ඔවුහු බොහෝ දේ දැන සිටියහ. ප්‍රදශර්නය නැරඹීමට පැමිණි ඇතමුන් Irvin Stone විසින් වැන් ගෝ පිළිබඳව රචනා කර ඇති කෘතියේ සිංහල පරිවතර්නයක් වූ විශාල පොතක් රැගෙනවිත් තිබුණි. ඇතමුන් ඊට පෙර දින ඔවුන් විසින් වැන්ගෝ ගේ තරු පිරි රාත්‍රිය(Starry Night) සිතුවම කඩදාසි මත හෝ බෝඩ් මත පමණක් නොව ඔවුන් හැඳ සිටි කමිස සහ ටීෂර්ට් මතද සිතුවම් කොට ඇඳගෙන ආ ඇඳහිය නොහැකි අවස්ථා තිබුනි. මෙම සිතුවමට සහ වැන් ගෝ ට (Van Gogh) උමතු වූ ලාංකික තරුණ කලාකාමීන් ඒ හා සමාන ආකාරයෙන් කරන ලද ප්‍රතිනිමර්ාණ ඉතා උසස් මට්ටමක පැවතුණි. Sky Gallery හිදී ප්‍රදශර්නය කරන ලද මෙම සිතුවම (Starry Night) කොළඹ දී වඩාත්ම ඡායාරූප ගත කරන ලද අංගය ලෙස දැක්වීම අතිශෝක්තියක් නොවේ. එම සිතුවම පසුබිම් වන ලෙස ගත් ඡායාරූප සහ අනෙකුත් සිතුවම් සමග ගන්නා ලද ඡායාරූප දහස් ගණනක් (වීඩියෝ දශර්නද ඇතුළත්ව) සමාජ මාධ්‍ය ඔස්සේ සැරිසැරූ අතර ඒ පිළිබඳව ඔවුන් විසින් කරන ලද සමාලෝචනයන්ද (cameo reviews) ඒ අතර විය.

අප වඩාත් සංවේදී වූ කරුණ නම් මෙබඳු ප්‍රදශර්නයක් ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් කිරීම පිළිබඳව ඔවුන් දක්වන ලද නිහතමානී කෘතවේදී බවයි. වින්සන්ට් වැන් ගෝ (Vincent Van Gogh) ගේ සිතුවම් සමීපව නැරඹීමට හැකි වීම බොහෝ දෙනෙකුට සිහිනයකි. එමෙන්ම එය ඔවුන් අත්විඳීමට අපේක්ෂාවෙන් සිටි අත්දැකීම් ගොන්නට එක් වූ තවත් අපූර්ව අත්දැකීමක් විය.ඇතැමුන් පැය තුන හතර ප්‍රදශර්න ශාලාව තුළ ගත කළේ එම දශර්නය දමා යාමට අපහසු නිසා බව අප සමග පැවසීය. තවත් සමහරු ප්‍රදශර්නය නැරඹීමට නැවත නැවතත් පැමිණියහ. අමුත්තන්ගේ සටහන් පොත ප්‍රදශර්නය අවසන් වන විට ඔවුන් ඒ පිළිබඳව දක්වන ලද අදහස්වලින් පිරී පැවතුනි. මෙම අදහස් දිනක පළ කිරීම වටී. මක්නිසාද යත් දැවැන්ත අබර්ුදයකින් ගොඩ ඒමට ප්‍රයත්න දරමින් සිටින අපේ ජනතාවගේ (විශේෂයෙන් අපේ රටේ තරුණ තරුණියන්ගේ) සැබෑ හැඟීම් සහ හද ගැස්ම එමගින් පිළිබිඹු වන බැවිනි.

බොහෝ ඈත ප්‍රදේශවල සිට පැමිණි රජයේ පාසල් වල චිත්‍ර ගුරුවරුන් ප්‍රදශර්නය නැරඹූ අතර පුද්ගලික චිත්‍ර පාසල්වල ගුරුවරුන් සිය සිසු දරුවන් ප්‍රදශර්න ශාලාව තුළ රැගෙන යමින් දරුවන්ට එම සිතුවම් පිළිබඳව පැහැදිලි කර දුන්නේ ඉතා ආශාවෙනි. වැන් ගෝ පිළිබඳව චිත්‍ර සම්බන්ධ ව්‍යාපෘති කළ සිසුන් කෙටි සටහන් පොත්වල සටහන් තබමින් සැරිසැරුවේ ඉතා නොඉවසිල්ලෙනි. එක් විශ්ව විද්‍යාලයක් සිසුන් හට පවරා තිබුනේ තෝරාගත් එක් වැන්ගෝ සිතුවමක් පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ප්‍රතිනිමර්ාණය කර අනෙක් සිසුන් හට ඉදිරිපත්

කිරීමටය.වැන් ගෝ ගේ ජීවිතය සහ කලාව පිළිබඳව අප සමඟ කතා කිරීමට ඔවුන්ට අවශ්‍ය විය. මේ සියල්ල කිරීමට අපි ඔවුන්ට සියලු නිදහස ලබා දුනිමු.

මා තුළ වඩාත් කුතුහලය ජනිත කළ කරුණක් වූයේ ප්‍රදශර්නය නැරඹූ තරුණ පිරිස් අතර සිතුවම් කලාව පිළිබඳ සුවිශේෂී උනන්දුවක් දැක්වූ  බොහෝ දෙනකු විද්‍යා විෂය ධාරාවෙන් අධ්‍යාපනය හදාරන සිසුන්, උපාධි අපේක්ෂකයින් සහ උපාධිධාරීන් වීමයි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට චිත්‍ර ශිල්පය පිළිබඳ නිපුණතාවක් තිබූ අතර ඔවුන්ගේ  දුරකථන වල සටහන් කර තිබූ නිමර්ාණයන් මා හට පෙන්වන ලද්දේ අන් අයට නොපෙනෙන අයුරිනි. මනා ශිල්පීය කුසලතාවක් ඔවුන් බොහෝ දෙනෙකු සතුව පැවති අතර මාගේ පියාණන්ට උපහාරයක් වශයෙන් මා විසින් ගොඩ නගා ඇති කලා සංසදය(Sky Gallery) තුළ ඔවුන්ගේ නිමර්ාණ එළි දැක්වීමට ඉඩකඩ සලසා දෙන බවට මම ඔවුන්ට පොරොන්දු වූයෙමි. අවසන් වසරේ වෛද්‍ය සිසුන් මා අබියස අසුන් ගෙන පිළිසඳරක යෙදෙමින් පැවසූයේ එක් එක් සිතුවම තුළින් නිරූපිත භාවයන් හා මනෝ ගතික ස්වභාවයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඔවුන්ට දැඩි කුතුහලයක් ඇති බවයි. ඔවුන් සමඟ දොඩමලු වීම මට ද නවමු අත්දැකීමක් වූ අතර වෛද්‍ය වෘත්තිකයින් වීමට නියමිත ඔවුන් තම විෂය ක්ෂේත්‍රයට පරිබාහිර ක්ෂේත්‍රයක් පිළිබඳව උනන්දුවක් දැක්වීමද විශේෂත්වයක් විය.

මානසික රෝගී බව සහ සමාජයීය වශයෙන් ඒ පිළිබඳව දරන ආකල්ප බොහෝ දෙනාගේ කතාබහට ලක්වූ මාතෘකාවක් වූ අතර මෙම තත්ත්වය වින්සන්ට් වැන් ගෝ (Vincent Van Gogh) ජීවත් වූ දහනම වන සියවසේ සිට අද දක්වාම එනම් විසිඑක්වන සියවස දක්වාම නොවෙනස්ව පැවතීම පිළිබඳව ඔවුන් අදහස් ප්‍රකාශ කළේ කණගාටුවෙන් යුතුවය. පසුකාලීනව ඩොලර් මිලියන ගණනකට ඔහුගේ සිතුවම් අලෙවි වුවත් ඔහු ජීවත්ව සිටි කාලය තුළ දී ඔහුට අලෙවි කරගත හැකි වූයේ එකම එක සිතුවමක් පමණක් වීම පිළිබඳව ඔවුහු ප්‍රශ්ණ කළහ. ඔහු  තවත් බොහෝ සිතුවම් අලෙවි කොට තිබුණේ නම් ඔහුගේ මානසික සෞඛ්‍යය සහ ආත්ම අභිමානය වධර්නය වීමට තිබූ බවත් ඒ තුළින් ජීවිතයෙන් සමු ගැනීමට ඔහුට තිබූ අවශ්‍යතාව ඉස්මතු නො වන්නට ඉඩ තිබූ බවත් එහි පැමිණි බොහෝ දෙනෙකුගේ අදහස විය. ජීවිතය පවත්වාගෙන යාම සඳහා සිය සොයුරු තියෝ (Theo) මත මුළුමනින්ම යැපෙන්නට සිදුවීම සිය වටිනාකම හා ආත්ම අභිමානය ඉතා පහතට වැටී තිබීමට හේතුවයි. මෙයින් ප්‍රකට වන කරුණක් නම් අප  පුද්ගලයන් පිළිගැනීම, ඇගයීමට ලක් කිරීම සහ ගෞරව උපහාර දැක්වීම කළ යුතු වන්නේ ඔවුන් ජීවත්ව සිටියදී මිස මියගියාට පසුව නොවේ. වඩාත්ම වැදගත් කරුණක් වන්නේ මානසික රෝගී තත්ත්වයන්ගෙන් යුතු පුද්ගලයින් සමාජය තුළ කොන් කිරීමකට හෝ හංවඩු ගැසීමකට ලක් නොකොට සහනුකම්පාවෙන්, අවබෝධයෙන් සහ කරුණාවෙන් යුතුව ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කිරීමයි. එමගින් එබඳු තත්ත්වයන්ට සාථර්කව මුහුණ දීමේ හැකියාව ඔවුන් තුළ වධර්නය වනු ඇත. වින්සන්ට් වැන් ගෝ බොහෝ ශ්‍රී ලාංකිකයින් ගේ ජීවිතයට හදවතට මෙන් ම ආත්මයට වඩාත් සමීප වන්නේ මේ නිසාම බව මාගේ අදහසයි.

කලා නිමර්ාණයක් මුළුමනින්ම රස විඳීමට හෝ අත් විඳීමට නම් අප ඒ සඳහා පිවිසිය යුත්තේ ගෞරව සම්ප්‍රයුක්ත බියමුසු බවකින් නොව වඩාත් නිදහස් බවකින් හා නිරායාසයෙන් ඒ පිළිබඳව අප තුළ ජනිත වන හැඟීම් වලට ප්‍රතිචාර දැක්වීමට අවකාශය සලසා දෙමිනි. අප සංගීතය රසවිඳින සැහැල්ලු ස්වභාවයෙන් යුතුව සිතුවම් නිමර්ාණයක් සම්බන්ධයෙන් කටයුතු කළ යුත්තේ එමඟින් අපට වඩාත් හොඳින් අපවම හඳුනා ගැනීමටත් අපගේ සිනහව කඳුළ අවබෝධ කර ගැනීමටත් එය නිරන්තරයෙන් පිටිවහලක් වෙමින් දිරිමත් කරන බැවිනි.










pk_arts


32
VASE WITH
15 SUNFLOWERS
21

